# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,719 — 1966 ඔක්තෝබර් 27 වැනි බ්‍රහස්පතින්ද — 1966.10.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# II වැනි කොටස — අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් | — | පිස්කල් විකිණීම් පිළිබඳ දන්වීම් | 151 |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දන්වීම් | — | මුදල් නඩු පිළිබඳ දන්වීම් | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | — | නීති අධ්‍යාපන සභාවේ දන්වීම් | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දන්වීම් | — | නොතාරිස් ලැයිස්තුව | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දන්වීම් | — | විවිධ දන්වීම් | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම | — | | |


## පිස්කල් විකිණීම් පිළිබඳ දන්වීම්

### කළුතර දිස්ත්‍රික් නඩු ශාලාවේදීය

නැසීගිය ඩී. ඇස්. ඇල්පි සිංඤෝ නමැති අයගේ බූදලය සම්බන්ධයෙනි. දේශීය ආදායම් කොමසාරිස්.........පෙත්සම්කරු.

නො. ටී. 3645

නැසීගිය අයගේ බූදලය සම්බන්ධයෙන් වගකිවයුතු පාර්ශ්වය මත ඩී. ඇස්. ඇස්. කුලරත්න.............................වගඋත්තරකරු.

මෙහි පහත සඳහන් වන දේපලවලින් ඉහතකී නඩුවේ නැසීගිය අයට තිබෙන අයිතිවාසිකම් හා ප්‍රයෝජනයන් වර්ෂ 1966 ක් වූ නොවැම්බර් මස 23 වැනි දින පෙරවරු 10.30 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

මෙම ඉඩම් වෙන්දේසි කරනු ලබන්නේ රුපියල් තුන්දස් අටසිය හැට හතරක් හා එම මුදලට 59.9.23 දින සිට ගෙවන තෙක් 4% පොලිය, පිස්කල් ගාස්තු හා පවුන්ඩේජ් ගාස්තු අයකර ගැනීමටය.

1. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුනේ කළුතර බැද්දේ කළුතර වේලාපුර පිහිටි, හම්බවත්ත නමැති ඉඩම් කට්ටිය හා එහි තිබෙන පරණ පාරේ, වරිපණම් අංක 235 දරණ සියළුම ගොඩනැගිලි, වැටිලි හා සියලුම දේ. එකී ඉඩම් කට්ටියට මායිම් :—උතුරට : නැසීගිය ගෝමිස් මුදලියාර්ට අයිති ඉඩම හා යෝවින් දවඩුගේ ඩැනියෙල් බාස්ට අයිති ඉඩම ; නැගෙණහිරට : සී. ජේ. වීරරත්න නමැති අයට අයිති ඇතුළුගමගේ වත්ත ; දකුණට : ගල්හේනේ තෝනා හාමිනේගේ වත්තට යන පාර හා බස්නාහිරට : පරණ පාර. බලයලත් මිංනක තැනවත එච්. ජී. පෙරේරා මහතා සකස් කළ අංක 421 හා 1904.2.20 දින දරණ මිංනක සැලැස්ම අනුව ඉඩම් ප්‍රමාණය රූඩ් එකයි, පර්චස් දහනමයයි භාගයකි. (අක්. 0, රූඩ් 1, පර්. 19½).

2. ඉහතකී කළුතර, වේලාපුර පිහිටි පරණ පාරේ වරිපණම් අංක 235 ඒ හා බී දරණ ඇතුලු ගමගේවත්ත නමැති ඉඩමේ තිබෙන බිමෙන්, ගහ කොලින් හා සියලුම දෙයින් නොබෙදූ හතරෙන් තුන්

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පලකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ**

**විශෙෂ නිවේදනයයි**

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් එය එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1966 ජූලි මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

151—බී 66864—5,557 (66/10)

පංගුවක්. එකී ඉඩමට මායිම් :—උතුරට : දොන් දොමිංගු වඩු මෙස්ත්‍රිගේ දොන් සයිමන් බාස්ට අයිති තම්බිඅයියලගේ වත්ත; නැගෙනහිරට : අතුලුගමගෙවත්තේ නැගෙණහිර කොටස; දකුණට : කීටමෙස්ත්‍රිගෙවත්ත හා බස්නාහිරට : හම්බන්වත්ත හා ගල්ගේනගේ අද්‍රිනා තෝනා හාමිනේට අයිති ඉඩම. ඉඩම් ප්‍රමාණය රූඩ් දෙකක් වේ. (අක්. 0, රූඩ් 2, ප. 0). නමුත් ගිම්කම් ඔප්පුව අනුව නිවැරදිව කිවහොත් ඉඩම් ප්‍රමාණය රූඩ් එකයි, පර්චස් හයයි දශම තුනකි. (අක්. 0, රූඩ් 1, පර්. 6.3).

ස. ද. සි. විතාරන,
කළුතර නියෝජ්‍ය පිස්කල් වෙනුවට.

වර්ෂ 1966 ඔක්තෝබර් මස 18 වැනිදා,
කළුතර පිස්කල් කන්තෝරුවේදීය.

10-940/1

---

## කළුතර දිස්ත්‍රික් නඩු ශාලාවේදීය

නැසීගිය මහල්ලම් අබ්දුල් රහිමන් ලෙබ්බෙ ඉස්මායිල් ලෙබ්බෙ නමැති අයගේ බූදලය සම්බන්ධයෙනි. දේශීය ආදායම් කොමසාරිස් ........................................................................ පෙත්සම්කරු.

**නොම්මරය : විශෙෂ අයි. සී. පී/26**

ධර්ගා නගරයේ, අලුත් පාරේ, අංක 106 දරන ස්ථානයේ පදිංචි එම්. අයි. එම්. මන්සූර් බාරේ සිටින, නැසීගිය අයගේ බූදල් බලකාරයා වන මහල්ලම් ඉස්මයිල් ලෙබ්බෙ උම්මුල් හකීම් ........................................................................වගඋත්තරකරු.

මෙහි පහත සඳහන් වන දේපලවලින් ඉහතකී නඩුවේ නැසීගිය අයට තිබෙන අයිතිවාසිකම් හා ප්‍රයෝජනයන් වර්ෂ 1966 ක්වූ නොවැම්බර් මස 21 වැනි දින, පෙරවරු 10.30 ට එම ස්ථානයේදී, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. මෙම ඉඩම වෙන්දේසි කරනු ලබන්නේ රුපියල් එකසිය අනූහතරයි ශත අනූ එකක් (රු. 194.91) සහ එම මුදලට 1963.3.16 වැනි දින සිට ගෙවනතෙක් 4% පොලිය සහ එකතුවී ඇති පොලිය වන රුපියල් දහතුනයි ශත හතලිස් තුනක් (රු. 13.43) පිස්කල් ගාස්තු හා පවුන් ඩේජ් ගාස්තු අයකරගැනීමටය.

බස්නාහිර පලාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, කලුතර තොටමුනේ, අලුත්ගම් බැද්දේ, අලුත්ගම් වීදියේ ගොරකගහවත්ත නමැති ඉඩමේ අංක 1 දරන කට්ටිය හා එහි පිහිටි සියලුම දේට නැසීගිය මහල්ලම් අබ්දුල් රහිමන් ලෙබ්බෙ ඉස්මයිල් ලෙබ්බෙගේ අයිතිවාසිකම්, හිමිකම් හා සබඳකම්. එකී කට්ටියට මායිම් :—උතුරට : මෙම ඉඩමේ අංක 3 දරන කට්ටිය නොහොත් යූසුප් ලෙබ්බෙ මොහමඩ් ඉස්මායිල්ගේ ඉම්මට යන අඩි අටක පාර; නැගෙනහිරට : පිලිප්පුවන් තොට්ටම්; දකුණට : මෙම ඉඩමේ අංක 2 දරන කට්ටිය සහ බස්නාහිරට : කන්දේ විහාරයට යන පාර යනා මෙකී, මායිම් තුල පිහිටි පර්චස් විසිඅටයි තුනෙන් එක් පංගුවක් වූ අ. 0, රූ. 0, ප. 28 3/1 ඉඩම් ප්‍රමාණය.

ස. ද. සි. විතාරන,
කලුතර නියෝජ්‍ය පිස්කල් වෙනුවට.

වර්ෂ 1966 ඔක්තෝබර් මස 18 වැනිදා,
කලුතර පිස්කල් කන්තෝරුවේදීය.

10-940/2

---

## කළුතර දිස්ත්‍රික් නඩු ශාලාවේදීය

දියලගොඩ පදිංචි ඇන්. ඇම්. කැතරින් ප්‍රනාන්දු.....පැමිණිලිකාරයා.
**නොම්මරය : 30203** එදිරිව
15 හෝ 18, මග්ගොනු පදිංචි බ්‍රහ්මනහෙට්ටිගේ මෙරායා බියට්රිස්............................................ණය හිමි විත්තිකරු.
26, දියලගොඩ පදිංජි කොළඹ මෝදරපරණපටබැදිගේ එව්ලේලිය පෙරේරා............................................ණයකාර විත්තිකරු.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ 26 වැනි විත්තිකරුට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් එම ස්ථානයේදී වර්ෂ 1966 ක්වූ නොවැම්බර් මස 28 දින පෙරවරු 10.30ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ.

පහත සඳහන් ඉඩම විකුණනු ලබන්නේ ඇස්කිසි මුදල වන රුපියල් පන්දහස් විසි පහක් (රු. 5,025), පිස්කල් ගාස්තු හා පවුන්ඩේ ගාස්තුද අයකර ගැනීමටය.

**උපලේඛනය**

එච්. විජේසුරේන්ද්‍ර, අවසරලත් මානකතැන විසින් මැන සඳහලද අංක 805 සහ 1962.2.26 සහ 1962.2.25 වැනි දිනයන් දරන මානසැලැස්ම අනුව, බස්නාහිර පලාතේ, කලුතර දිස්ත්‍රික්කයේ, කලුතර තොටමුනේ, පයාගල-මග්ගොන බද්දේ, දියලගොඩ පිහිටි කුට්ටිය වත්ත සහ හල්දෙනියඕවිට හෙවත් වෙලගොඩකරපුවත්ත නමැති ඉඩමේ අංක 6බී දරන කොටසෙන් නොබෙදූ දෙකෙන් පංගුවක් (½) සහ එහි පිහිටි සියලු ගොඩනැගිලි, මීට මායිම්; උතුරට : පාර; නැගෙනහිරට : බන්දුවවත්ත සහ ඕවිට; දකුණට : හල්දෙනිය ඇල සහ බස්නාහිරට : එම ඉඩමේ අංක 1ඒ දරන කට්ටිය යන මෙකී මායිම් තුල පිහිටි රූඩ් එකයි, පර්චස් එකයි, දශම පහක් (අ 0, රූ. 1, ප. 1.5) ප්‍රමාණවූ ඉඩම.

ස. ද. සි. විතාරන,
කලුතර නියෝජ්‍ය පිස්කල් වෙනුවට.

වර්ෂ 1966 ඔක්තෝබර් මස 19 වැනිදා,
කළුතර පිස්කල් කන්තෝරුවේදීය.

10-959

---

## බදුලු දිසා උසාවියේදීය

ඇල්ල-හල්පේ ආයුර්වේද දිස්පැන්සරියේ වීරසිංහ මුදියන්සේලාගේ සුදුබණ්ඩා වීරසිංහ..........................පැමිණිලිකාරයා.

**නොම්මරය : ඇම්බී/4018** එදිරිව

උඩුකුඹල්වෙල "සොමි නිවසේ" ජයසිංහ මුදලිගේ විමලාවතී

(2) බණ්ඩාරවෙල පන්සල පාරේ "සිරි නිවසේ" ජයසිංහ මුදලිගේ බණ්ඩාරමැණිකා..........................විත්තිකාරයෝ.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරියන්ට තිබෙන අයිතිවාසිකම් සහ ප්‍රයෝජනයත් වර්ෂ 1966 ක්වූ නොවැම්බර් මස දහඅට වැනි දින පෙ. ව. 11 පැයට එම ඉඩම්වලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. එනම් : රුපියල් 1,000 ක් ද, 64.2.5 දින සිට මුලු මුදල ගෙවනතෙක් නිති පොලිය ද, නඩු ගාස්තුව ද, අයකර ගැනීම පිණිස.

1. ඌව දිසාවේ බදුලු දිස්ත්‍රික්කයේ මැදකිඳ කුඹල්වෙල කෝරළේ ඉඩමේ ගම පිහිටි, අංක 829 දරණ පාවිල ගන්තිලේ වී දෙපැල කුරුණි පහක පමණ වපසරිය කුඹුරට මායිම් :—උතුරට : ඔය; නැගෙනහිරට සහ දකුණට : මෙම කුඹුරේ ඉම නියර; බස්නාහිරට : ඉමනියර සහ ඔය යන මෙහි කුඹුරෙන් නොබෙදූ දෙකෙන් පංගුවක් ද,

මෙම ඉඩම බදුල්ලේ ඉඩම් ලියා පදිංචි කිරීමේ කන්තෝරුවේ "බී" 182/48 යටතේ ලියා පදිංචි කර ඇත.

2. එකී කුඹල්වෙල කෝරළේ හල්පේ ගම පිහිටි, දෙමන්පිටියේ වෙල කොච්ලතේ කුඹුර වී තුන් පැලක පමණ වපසරියට මායිම් :—උතුරට : දෙමන්පිටියේවෙල බඩල; නැගෙනහිරට : මෙම කුඹුරේ ඉමනියර සහ බඩල; දකුණට : මෙම කුඹුරේ ඉමනියර; බස්නාහිරට : කෝල්පිටියේ හෙවලිය යන මෙහි තුල කුඹුරෙන් නොබෙද දෙකෙන් පංගුවක් ද, යන මෙකී දේපල සහ ඒවාට අයිති සෑම සියලු දේත් වේ.

මෙම ඉඩම් බදුල්ලේ ඉඩම් ලියා පදිංචි කිරීමේ කන්තෝරුවේ "බී" 182/49 යටතේ ලියා පදිංචි කර ඇත.

විල්ප්‍රඩ් ඇ. සෙනරත්,
ඌව පලාතේ අතිරේක නියෝජ්‍ය පිස්කල් තැන.

වර්ෂ 1966 ක්වූ ඔක්තෝබර් 14,
බදුලු පිස්කල් කන්තෝරුවේ දී ය.

10-976

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනයද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස්වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් බාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහ ලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරී වෙත කෙලින් ම ගෙවිය යුතුය.

### උපලේඛනය
### 1966

| මාසය | | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් බාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|---|
| අගෝස්තු | ... | 66. 8. 5 | සිකුරාද | ... | 66. 7.29 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 8.12 | සිකුරාද | ... | 66. 8. 5 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 8.19 | සිකුරාද | ... | 66. 8.12 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 8.26 | සිකුරාද | ... | 66. 8.19 | සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් | ... | 66. 9. 2 | සිකුරාද | ... | 66. 8.26 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9. 9 | සිකුරාද | ... | 66. 9. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.16 | සිකුරාද | ... | 66. 9. 9 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.23 | සිකුරාද | ... | 66. 9.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66. 9.30 | සිකුරාද | ... | 66. 9.23 | සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | ... | 66.10. 7 | සිකුරාද | ... | 66. 9.30 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.14 | සිකුරාද | ... | 66.10. 7 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.20 | බ්‍රහස්පතින්ද | ... | 66.10.14 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.10.27 | බ්‍රහස්පතින්ද | ... | 66.10.20 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| නොවැම්බර් | .... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | ... | 66.10.27 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.10 | බ්‍රහස්පතින්ද | ... | 66.11. 3 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.18 | සිකුරාද | ... | 66.11.10 | බ්‍රහස්පතින්ද | දවල් 12 |
| | | 66.11.25 | සිකුරාද | ... | 66.11.18 | සිකුරාද | දවල් 12 |
| දෙසැම්බර් | ... | 66.12. 2 | සිකුරාද | ... | 66.11.24 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12. 9 | සිකුරාද | ... | 66.12. 2 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.16 | සිකුරාද | ... | 66.12. 8 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | | 66.12.23 | සිකුරාද | ... | 66.12.16 | සිකුරාද | ප.ව. 3.30 |
| | | 66.12.30 | සිකුරාද | ... | 66.12.22 | බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1966 ජූලි 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි